# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,063 - 2018 මාර්තු මස 16 වැනි සිකුරාදා - 2018.03.16**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# (IVආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| තනතුරු- ඇබෑර්තු ... ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 496 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 500 |


සැ. යු. - (i) දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත 2018 මාර්තු මස 09 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත 2018 මාර්තු මස 09 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2018 අප්‍රේල් මස 06 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2018 මාර්තු මස 23 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ. බ.*)

2018 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පළාත් පාලන නිවේදන

## මහර ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 198 වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

1989 අංක 12 දරන (ආනුෂාංගික විධිවිධාන) පනතේ දෙවන වගන්තිය සමඟ කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 198 වගන්තිය ප්‍රකාරව කටයුතු කරමින් බස්නාහිර පළාතේ ගරු ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂය භාර අමාත්‍යතුමාගේ අනුමැතිය ලැබී ඇති පහත උපලේඛනයේ සඳහන් මාර්ග ඉදිරියෙන් දක්වන පරිදි නම් කර ඇති බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එස්.ඒ.කේ.එන්. ඉන්ද්‍රජිත්,
ලේකම් හා සභාවේ බලතල කාර්ය,
කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
මහර ප්‍රාදේශීය සභාව,
පහළ කරගහමුණ,
කඩවත.

2018 පෙබරවාරි මස 27 වැනි දින.

| *අනු අංකය* | *මාර්ගයේ නම* | *මාර්ගය ආරම්භය* | *මාර්ගයේ අවසානය* | *මාර්ගය අළුතින් නම් කර ඇති නාමය* |
|---|---|---|---|---|
| 01 | මාහේන ප්‍රදේශයේ අතුරු මාර්ගය | මාහේන පාර | සංධ්‍යා මහත්මියගේ නිවස දක්වා | වැලිවත්ත මාවත |
| 02 | ගෝනහේන ප්‍රාදේශයේ අතුරු මාර්ගය | ගෝනහේන ප්‍රධාන පාර | අංක 254/9, ජේ.ඒ.ආර්. පද්මිණී මහත්මියගේ නිවස දක්වා | දෙල්ගහවත්ත පාර |
| 03 | 285 උඩුපිල උතුර ග්‍රාම නිලධාරී වසමට අයත් මිල්ලගහලන්ද ඉඩමට යන පිවිසුම් මාර්ගය | උඩුපිල මාර්ගය | අංක 397, පී.ජී. අමරසිරි මහතාගේ නිවස දක්වා | මිල්ලගහලන්ද පාර |
| 04 | කැන්දලියැද්දපාළුව කැටගැලගහවත්ත ප්‍රදේශය හරහා වැටී ඇති පාර | පොකුණ හංදිය පාර | පරණ ගම්පහ පාර | කැටකැලගහවත්ත පාර |
| 05 | වැබඩ උඩුපිල පාරේ දකුණට විහිදෙන අතුරු මාර්ගය | වැබඩ උඩුපිල පාර | 135/සී, ප්‍රදීප් සනත් මහතාගේ නිවස දක්වා | ශ්‍රී විජය පාර |

03 - 567

## සොරණාතොට ප්‍රාදේශීය සභාව

### 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

2017.11.10 වැනි දින ගැසට් පත්‍රයේ IV (ආ) කොටසේ පළකල පරිදි 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (1) වගන්තිය ප්‍රකාර ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, සොරණාතොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පිහිටි පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති මංමාවත් සොරණාතොට ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශ කිරීම සම්බන්ධයෙන් අදාල ඉඩම් හිමිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශවයන් විසින් මේ වන තෙක් කිසිදු විරෝධතාවයක් ප්‍රකාශ නොවූ බැවින් එම මංමාවත් සොරණාතොට ප්‍රාදේශීය සභාව සතු මංමාවතක් වශයෙන් පිළිගෙන පාලනය කරන බව පොදු මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

### උපලේඛනය

| *මාර්ගයේ නම* | *තිඹිරිගස්පිටිය පඩිපෙල පාර* | *රිදීපාන අප්ලන්ඩ් පළවෙනි වම් අතුරු මාර්ගය* |
|---|---|---|
| මාර්ගයේ ආරම්භය | මහියංගනය - බදුල්ල ප්‍රධාන මාර්ගය | රිදීපාන අප්ලන්ඩ් මාර්ගය |
| මාර්ගයේ අවසානය | කුඹුරු ඇල | චන්ද්‍රිකා කුමාරි මියගේ ඉඩම |
| ග්‍රාමසේවක වසම හා අංකය | 26 සී, රිදීපාන | 26 සී, රිදීපාන |
| මාර්ගයේ දිග | මීටර් 147 | මීටර් 175 |
| මාර්ගයේ පළල | අඩි 10 | අඩි 10 |
| මාර්ගය ආරම්භයේ සිට අවසානය දක්වා වම් පස ඉඩම් හිමියන්ගේ නම් | ඩී.එම්. අසංක දිසානායක මහතා<br>ආර්.එම්. අශෝක බණ්ඩාර මහතා<br>ආර්.එම්. රත්නසිරි මහතා<br>ඒ.ඩබ්ලිව්.බී. එගොඩවෙල මහතා<br>ආර්.එම්. අනුලාවති මහත්මිය | දීපා මාරසිංහ මිය<br>එස්.එම්. සමරවීර මහතා |
| මාර්ගයේ ආරම්භයේ සිට අවසානය දක්වා දකුණු පස ඉඩම් හිමියන්ගේ නම්. | ඩබ්ලිව්.එම්. සමදරා වීරසිංහ මිය<br>ආර්.එම්. ජයසේකර මහතා<br>ආර්.එම්. සෝමසිරි මහතා<br>ආර්.එම්. අනුලාවති මහත්මිය<br>ආර්.එම්. කරුණාවති මහත්මිය<br>බී. විමලසේකර මහතා<br>ආර්.එම්. උදය රත්නායක මහතා | ලාල් රත්නායක මහතා<br>ආර්.එම්. ධර්මසේන මහතා<br>චන්ද්‍රිකා කුමාරි මිය |

එල්.ජී.ආර්. ශාන්තිලතා,
සභා ලේකම්,
සොරණාතොට ප්‍රාදේශීය සභාව.

2018 පෙබරවාරි 26 වැනි දින සොරණාතොට ප්‍රාදේශීය සභා කාර්යාලයේ දීය.

03 - 647

## උඩුනුවර ප්‍රාදේශීය සභාව

### ගෝ ඝාතක ආඥාපනත (272 වැනි අධිකාරය)

මෙහි උපලේඛනයෙහි සඳහන් අය විසින් ඒ අයගේ නම ඉදිරියෙන් සඳහන් ගෝඝාතකාගාරයේ මස් පිණිස සතුන් ඝාතනය කිරීමටත්, නම ඉදිරියෙන් සඳහන් මස් වෙළඳ සැලෙහි මස් වෙළඳාම් කිරීමටත් 2018 වර්ෂය සඳහා බලපත්‍රයක් ඉල්ලුම් කර තිබෙන බව ගෝ ඝාතක ආඥාපනතේ (272 වැනි අධිකාරය) 7/(2) වැනි වගන්තියෙන් මෙයින් දැනුම් දෙනු ලැබේ.

02. මෙම බලපත්‍රය නිකුත් කිරීම සඳහා විරෝධතාවයන් දැක්වීමට අදහස් කරන උඩුනුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි ඕනෑම අයකුට ඔහුගේ/ ඇයගේ විරෝධතාවය සඳහා හේතුව දක්වමින් පිටපත් දෙකකින් යුතු ලියවිල්ලක් මෙම දැන්වීම *ගැසට් පත්‍රයේ* පළවන දින සිට දින දහහතරක් (දින 14 ක්) ඇතුළත මා වෙත එවන ලෙස මෙයින් ඉල්ලා සිටිනු ලැබේ.

ජී. යූ. ගුණසිංහ,<br>ලේකම්,<br>උඩුනුවර ප්‍රාදේශීය සභාව.

2018 පෙබරවාරි මස 23 වැනි දින,<br>ගෙලිඔය පිහිටි උඩුනුවර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

| 2018 වර්ෂය | | | | | |
|---|---|---|---|---|---|
| *අනු. අංකය* | *නම* | *පදිංචි ලිපිනය* | *ව්‍යාපාරික ස්ථානය* | *ව්‍යාපාරය* | *අලෙවි සඳහා මස් ලබා ගැනීම* |
| 1 | එම්. එස්. එම්. මුස්තාක් මයා | 426, නව ඇල්පිටිය, ගෙලිඔය | 429, කළුගමුව පාර, ගෙලිඔය | එළුමස් අලෙවිය | අංක 426, නව ඇල්පිටිය, ගෙලිඔය. |
| 2 | එම්. එස්. ආර්. අස්රන් මයා | 479/3/1, කළුගමුව පාර, ගෙලිඔය | අංක 16, කළුගමුව පාර, ගෙලිඔය | ගවමස් අලෙවිය | එගොඩ කළුගමුව, ගෙලිඔය. |
| 3 | එච්. එම්. එම්. හිල්මි මයා | අංක 115, නුවර පාර, වෙළම්බොඩ | අංක 48, නුවර පාර, වෙළම්බොඩ | ගවමස් අලෙවිය | 115, නුවර පාර, වෙළම්බොඩ |
| 4 | එම්. එස්. එම්. සිද්දීක් මයා | 490/2/ඩී, කළුගමුව, ගෙලිඔය | 330, දෙල්ලංග, ගෙලිඔය | ගවමස් අලෙවිය | අංක 75, දවුලගල, හන්දෙස්ස |
| 5 | එම්. එෆ්. මොහොමඩ් සාදික් මයා | 528/2, නව ඇල්පිටිය, ගෙලිඔය | අංක 6/බී, කළුගමුව පාර, ගෙලිඔය | ගවමස් අලෙවිය | |
| 6 | එම්. ඒ. සාජික් අහමඩ් මයා | අංක 29/6, රූකවල්පොල, වෙළම්බොඩ | 58/බී, කුරදෙණිය පාර, වෙළම්බොඩ | ගවමස් අලෙවිය | අංක 252, රූකවල්පොළ, වෙළම්බොඩ |
| 7 | ඒ. එල්. එම්. නවුෂාඩ් මයා | 234, අප්පල්ලාගොඩ බටහිර, වටදෙනිය, වෙළම්බොඩ | 5/2, රූකවල්පොළ, වෙළම්බොඩ | ගවමස් අලෙවිය | දිගාවත්ත, වටදෙණිය |

| අනු. අංකය | නම | පදිංචි ලිපිනය | ව්‍යාපාරික ස්ථානය | ව්‍යාපාරය | අලෙවි සඳහා මස් ලබා ගැනීම |
|---|---|---|---|---|---|
| 8 | එම්. පී. එම්. සියාන් මයා | අංක 07/බී, දොඹගොල්ල, මුරුතග හමුල | අංක 383, හගුරන්කෙවත්ත, බූවැලිකඩ | ගවමස් අලෙවිය | 209, නුවර පාර, දවුලගල |
| 9 | එම්. එස්. එම්. රියාස් මයා | අංක 195, මාහින්ගොඩ, හන්දෙස්ස | අංක 209, නුවර පාර, දවුලගල, හන්දෙස්ස | ගවමස් අලෙවිය | අංක 195, මාහිංගොඩ, හන්දෙස්ස |
| 10 | එම්. එස්. එම්. නිෂාම් මයා | 27/10, වටදෙණිය, වෙළම්බොඩ | 141, වටදෙණිය, වෙළම්බොඩ | ගවමස් අලෙවිය | අංක 100, සියඹලාවත්ත, වටදෙණිය |
| 11 | ජේ. එම්. එම්. අස්මි මයා | 49/සී, දස්කර, මුරුතගහමුල | 330, බූවැලිකඩ, ලීමගහකොටුව | ගවමස් අලෙවිය | |
| 12 | ඒ. එන්. ෂාරුක් මයා | 133/C, දුම්පල්ලංග, හන්දෙස්ස | 61/බී, ලීමගහකොටුව, බූවැලිකඩ | ගවමස් අලෙවිය | අංක 75, දුම්පල්ලංග, හන්දෙස්ස |
| 13 | ඒ. එම්. හසන් මයා | 133/ඩී, දුම්පල්ලංග, හන්දෙස්ස | 211, පේරාදෙණිය, දවුලගල | ගවමස් අලෙවිය | අංක 75, දුම්පල්ලංග, හන්දෙස්ස |
| 14 | ෆාතිමා රිසානා | 133/ඩී, දුම්පල්ලංග, හන්දෙස්ස | අංක 75, දුම්පල් අංග පාර, දවුලගල | ගෝඝාතකාගාරය | ඝාතකාගාරය |
| 15 | එම්. එච්. එම්. හිල්මි මයා | 115, නුවර පාර, වෙළම්බොඩ | අංක 100, සියඹලාග හමුලවත්ත, වෙළම්බොඩ | ගෝඝාතකාගාරය | ඝාතකාගාරය |
| 16 | එම්. එස්. එම්. රිසාඩ් මයා | අංක 195, මාහිංගොඩ, හන්දෙස්ස | දවුලගල, හන්දෙස්ස | ගෝඝාතකාගාරය | ඝාතකාගාරය |
| 17 | එන්. ඒ. සාජිත් අහමඩ් මයා | 20/5, රුකවල්පොල, වෙළම්බොඩ | අංක 252, රුකවල්පොළ, වෙළම්බොඩ | ගෝඝාතකාගාරය | ඝාතකාගාරය |
| 18 | ඒ. එල්. එස්. නවුෂාඩ් මයා | 234, අප්පල්ලාගොඩ බටහිර, වටදෙනිය, වෙළම්බොඩ | රුකවල්පොළ, දිගාවත්ත, වෙළම්බොඩ | ගෝඝාතකාගාරය | ඝාතකාගාරය |

03-583

## හැටන් දික්ඔය නගර සභාව

විනෝද බදු පැනවීම

(255 වන අධිකාරිය වූ) නගර සභා ආඥා පනතේ 184 (අ) වගන්තිය ප්‍රකාර හා (599 වන අධිකාරිය වූ) විනෝද බදු ආඥා පනතේ දෙවන වගන්තියේ (1) වන උප වගන්තිය අනුව ලැබී ඇති බලතල ප්‍රකාරව හැටන් දික්ඔය නගර සභා බල ප්‍රදේශය තුළ විනෝද බදු 10% (සියයට දහයක ප්‍රතිශතයක්) අය කිරීමට තීරණය කරමි.

මෙම ප්‍රතිශතය මධ්‍යම පළාත් ගරු ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂය භාර ඇමතිතුමා විසින් අනුමත කර ගැසට් පත්‍රයේ පළ කළ දින සිට හෝ එම ගැසට් පත්‍රයේ සඳහන් වූ දින සිට බලපවත්වන්නේය.

එස්. ප්‍රියදර්ශනී,
ලේකම්,
හැටන් දික්ඔය නගර සභාව.

2018 පෙබරවාරි 22 වැනි දින,
හැටන් දික්ඔය නගර සභා කාර්යාලයේ දී ය.

03-584

---

# විවිධ දැන්වීම්

## දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව

2018 වර්ෂය සඳහා ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතා කිරීම සඳහා ගාස්තු අය කිරීම

දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව විසින් 2017.12.28 වන දින පැවති විශේෂ කළමණාකරණ කමිටුවේ නිර්දේශ සලකා බලා බලය ලත් නිලධාරි කාර්යය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරියා වශයෙන් මහා නගර සභා ආඥා පනතේ 286 (අ) වගන්තිය ප්‍රකාරව නාගරික කොමසාරිස්වරයා විසින් පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනයා වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ධම්මික මුතුගල,
බලතල කාර්යය හා කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරි.

2018 ජනවාරි 20 වැනි දින,
දෙහිවල ගල්කිස්ස මහා නගර සභා කාර්යාලයේ දී ය.

දෙහිවල ගල්කිස්ස මහා නගර සභා බල ප්‍රදේශයේ පවත්වනු ලබන ප්‍රියසාද සහ අනෙකුත් වැඩ සටහන්වලදී ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතා කිරීමට අවසර ලබා දීමේදී කිසිදු ගාස්තුවක් අය නොකල අතර එකී කාර්යය ඉටු කිරීමේ දී සභාවෙන් ලිපිද්‍රව්‍ය සඳහා වැයවන මුදල ලෙස රු. 250 ක ගාස්තුවක් 2018.01.01 දින සිට අය කරනු ලැබේ.

| *විස්තර* | *ගාස්තුව* |
|---|---|
| ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතා කිරීම සඳහා ගාස්තු | රු. 250.00 |

03-590

## දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව

2018 වර්ෂය සඳහා තක්සේරු දේපළවලට අදාළව ගෙවීම් පිළිබඳ වාර්තා හා හිඟ වරිපනම් බදු වාර්තා ලබා දීම සඳහා ගාස්තු අය කිරීම

දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව විසින් 2017.12.28 වන දින පැවති විශේෂ කළමණාකරණ කමිටුවේ නිර්දේශ සලකා බලා බලය ලත් නිලධාරි කාර්යය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරියා වශයෙන් මහ නගර සභා ආඥා පනතේ 286 (අ) වගන්තිය ප්‍රකාරව නාගරික කොමසාරිස්වරයා විසින් පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනයා වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ධම්මික මුතුගල,
බලතල කාර්යය හා කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරි.

2018 පෙබරවාරි 12 වැනි දින,
දෙහිවල ගල්කිස්ස මහා නගර සභා කාර්යාලයේ දී ය.

දෙහිවල ගල්කිස්ස මහා නගර සභා බල ප්‍රදේශය තුළ පිහිටි සියළු දේපළ වලට අදාළ වරිපනම් බදු අයවීම හා වරිපනම් බදු ගෙවීම පිළිබඳ වාර්තා හා හිඟ වරිපනම් බදු පිළිබඳ වාර්තා ලබාගැනීමේ දී රු. 300/- ක ගාස්තුවක් 2018.01.01 දින සිට අය කරනු ලැබේ. තවද එම ගාස්තුවට අදාළ එකතු කළ අගය මත වන බදු හා ජාතිය ගොඩනැගීමේ බදු හා පිටපත් ගාස්තු වශයෙන් රු. 200/- ක මුදලක් අය කරනු ලැබේ.

03-591

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.